# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA


| | |
|---|---|
| **නිකුත් කළේ** | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| **දිනය** | 2021.01.29 |

## කො.පා.මි.ද මත පදනම් වූ උද්ධමනය 2021 ජනවාරි මාසයේ දී සියයට 3.0 දක්වා පහළ යන ලදී

**මතුපිට උද්ධමනය**
- වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය : 3.0%
- වාර්ෂික සාමාන්‍ය උද්ධමනය : 4.3%
- මාසික වෙනස : 0.51%

**මූලික උද්ධමනය**
- වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය : 2.7%
- වාර්ෂික සාමාන්‍ය උද්ධමනය : 3.1%
- මාසික වෙනස : 0.4%

**කො.පා.මි.ද. වාර්ෂික ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනසෙහි විචලනය**




**කො.පා.මි.ද. මාසික ප්‍රතිශත වෙනස සඳහා දායකත්වය**




කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (කො.පා.මි.ද., 2013=100)[1] වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2020 දෙසැම්බර් මාසයේ පැවති සියයට 4.2හි සිට 2021 ජනවාරි මාසයේ දී සියයට 3.0 දක්වා පහළ ගියේය. 2020 ජනවාරි මාසයේ පැවති ඉහළ පදනම් අගය මගින් ඇති වූ සංඛ්‍යානමය බලපෑම මේ සඳහා හේතු විය. මේ අතර, ආහාර කාණ්ඩයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය 2020 දෙසැම්බර් මාසයේ පැවති සියයට 9.2හි සිට 2021 ජනවාරි මාසයේ දී සියයට 6.8 දක්වා පහළ ගියේය. එමෙන්ම, ආහාර නොවන කාණ්ඩයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය 2020 දෙසැම්බර් මාසයේ පැවති සියයට 2.0හි සිට 2021 ජනවාරි මාසයේ දී සියයට 1.4 දක්වා පහළ ගියේය.

වාර්ෂික සාමාන්‍ය පදනම මත මනිනු ලබන කො.පා.මි දර්ශකයෙහි වෙනස දෙසැම්බර් මාසයේ පැවති සියයට 4.6හි සිට 2021 ජනවාරි මාසයේ දී සියයට 4.3 දක්වා පහළ ගියේය.

2021 ජනවාරි මාසයේ දී කො.පා.මි. දර්ශකයෙහි මාසික වෙනස සියයට 0.51ක් ලෙස වාර්තා විය. ආහාර සහ ආහාර නොවන යන කාණ්ඩ දෙකෙහිම අයිතමවල මිල ගණන්හි සිදු වූ ඉහළ යෑම් මේ සඳහා හේතු විය. තවද, 2021 ජනවාරි මාසයේ දී ආහාර සහ ආහාර නොවන කාණ්ඩවල මාසික වෙනස්වීම් පිළිවෙළින්, සියයට 0.29ක් සහ සියයට 0.22ක් ලෙස වාර්තා විය. ඒ අනුව, 2021 ජනවාරි මාසයේ දී ආහාර කාණ්ඩයෙහි රතු ළූණු, පොල් සහ නැවුම් මත්ස්‍ය මිල ගණන් ඉහළ ගියේය. එසේ වුවද, මාසය තුළ දී ලොකු ළූණු මිල ගණන්හි පහළ යෑමක් වාර්තා විය. මේ අතර, ප්‍රධාන වශයෙන්ම සෞඛ්‍යය (පෞද්ගලික රෝහල් ගාස්තු) උපකාණ්ඩයේ දක්නට ලැබුණු මිල ගණන් ඉහළ යෑම හේතුවෙන්, ආහාර නොවන කාණ්ඩයෙහි අයිතමවල මිල ගණන්හි ඉහළ යෑමක් 2021 ජනවාරි මාසයේ දී දක්නට ලැබුණි.

---

[1] කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද., 2013=100), ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබයි.

ආර්ථිකයෙහි යටිදැරි උද්ධමනය නිරූපණය කරන වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය, 2020 දෙසැම්බර් මාසයේ දී පැවති සියයට 3.5හි සිට 2021 ජනවාරි මාසයේ දී සියයට 2.7 දක්වා පහළ ගියේය. එසේ වුවද, වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය 2021 ජනවාරි මාසයේ දී ද සියයට 3.1හි නොවෙනස්ව පැවතුණි.

## දත්ත ඇමුණුම

### සංඛ්‍යා සටහන 1 : කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි හැසිරීම

**පදනම : 2013 = 100**

| වසර | මාසය | දර්ශක අගය | | මාසික % වෙනස | | වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස | | වාර්ෂික සාමාන්‍ය % වෙනස | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) |
| 2018 | ජනවාරි | 122.8 | 125.6 | -0.1 | 0.6 | 5.8 | 3.5 | 6.6 | 5.6 |
| | පෙබරවාරි | 121.9 | 125.8 | -0.7 | 0.2 | 4.5 | 3.5 | 6.4 | 5.3 |
| | මාර්තු | 121.4 | 125.9 | -0.4 | 0.1 | 4.2 | 3.4 | 6.1 | 5.0 |
| | අප්‍රේල් | 121.5 | 126.2 | 0.1 | 0.2 | 3.8 | 3.5 | 5.9 | 4.7 |
| | මැයි | 122.9 | 126.4 | 1.2 | 0.2 | 4.0 | 3.2 | 5.7 | 4.5 |
| | ජූනි | 125.4 | 127.0 | 2.0 | 0.5 | 4.4 | 3.4 | 5.6 | 4.4 |
| | ජූලි | 125.8 | 127.3 | 0.3 | 0.2 | 5.4 | 3.9 | 5.6 | 4.3 |
| | අගෝස්තු | 125.8 | 127.5 | 0.0 | 0.2 | 5.9 | 3.7 | 5.6 | 4.1 |
| | සැප්තැම්බර් | 124.9 | 128.0 | -0.7 | 0.4 | 4.3 | 3.8 | 5.4 | 3.9 |
| | ඔක්තෝබර් | 124.6 | 128.1 | -0.2 | 0.1 | 3.1 | 3.8 | 5.0 | 3.8 |
| | නොවැම්බර් | 126.2 | 128.9 | 1.3 | 0.6 | 3.3 | 3.4 | 4.6 | 3.6 |
| | දෙසැම්බර් | 126.3 | 128.8 | 0.1 | -0.1 | 2.8 | 3.1 | 4.3 | 3.5 |
| 2019 | ජනවාරි | 127.4 | 132.5 | 0.9 | 2.9 | 3.7 | 5.5 | 4.1 | 3.7 |
| | පෙබරවාරි | 126.8 | 132.6 | -0.5 | 0.1 | 4.0 | 5.4 | 4.1 | 3.8 |
| | මාර්තු | 126.6 | 133.0 | -0.2 | 0.3 | 4.3 | 5.6 | 4.1 | 4.0 |
| | අප්‍රේල් | 127.0 | 133.1 | 0.3 | 0.1 | 4.5 | 5.5 | 4.1 | 4.2 |
| | මැයි | 129.0 | 134.2 | 1.6 | 0.8 | 5.0 | 6.2 | 4.2 | 4.4 |
| | ජූනි | 130.2 | 134.4 | 0.9 | 0.1 | 3.8 | 5.8 | 4.2 | 4.7 |
| | ජූලි | 130.0 | 134.6 | -0.2 | 0.1 | 3.3 | 5.7 | 4.0 | 4.8 |
| | අගෝස්තු | 130.1 | 134.6 | 0.1 | 0.0 | 3.4 | 5.6 | 3.8 | 5.0 |
| | සැප්තැම්බර් | 131.1 | 135.2 | 0.8 | 0.4 | 5.0 | 5.6 | 3.9 | 5.1 |
| | ඔක්තෝබර් | 131.3 | 135.2 | 0.2 | 0.0 | 5.4 | 5.5 | 4.0 | 5.3 |
| | නොවැම්බර් | 131.7 | 135.5 | 0.3 | 0.2 | 4.4 | 5.1 | 4.1 | 5.4 |
| | දෙසැම්බර් | 132.4 | 135.0 | 0.5 | -0.4 | 4.8 | 4.8 | 4.3 | 5.5 |
| 2020 | ජනවාරි | 134.6 | 136.5 | 1.7 | 1.1 | 5.7 | 3.0 | 4.5 | 5.3 |
| | පෙබරවාරි | 134.6 | 136.9 | 0.0 | 0.3 | 6.2 | 3.2 | 4.6 | 5.1 |
| | මාර්තු | 133.4 | 136.9 | -0.9 | 0.0 | 5.4 | 2.9 | 4.7 | 4.9 |
| | අප්‍රේල් | 133.6 | 137.2 | 0.1 | 0.2 | 5.2 | 3.1 | 4.8 | 4.7 |
| | මැයි | 134.2 | 138.1 | 0.4 | 0.7 | 4.0 | 2.9 | 4.7 | 4.4 |
| | ජූනි | 135.3 | 138.6 | 0.8 | 0.4 | 3.9 | 3.1 | 4.7 | 4.2 |
| | ජූලි | 135.4 | 138.9 | 0.1 | 0.2 | 4.2 | 3.2 | 4.8 | 4.0 |
| | අගෝස්තු | 135.4 | 138.9 | 0.0 | 0.0 | 4.1 | 3.2 | 4.8 | 3.8 |
| | සැප්තැම්බර් | 136.3 | 139.1 | 0.7 | 0.1 | 4.0 | 2.9 | 4.7 | 3.6 |
| | ඔක්තෝබර් | 136.5 | 139.2 | 0.1 | 0.1 | 4.0 | 3.0 | 4.6 | 3.4 |
| | නොවැම්බර් | 137.1 | 139.6 | 0.4 | 0.3 | 4.1 | 3.0 | 4.6 | 3.2 |
| | දෙසැම්බර් | 138.0 | 139.7 | 0.7 | 0.1 | 4.2 | 3.5 | 4.6 | 3.1 |
| 2021 | ජනවාරි | 138.7 | 140.2 | 0.5 | 0.4 | 3.0 | 2.7 | 4.3 | 3.1 |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව